din-07-26-uns-072321-54x8-wss

WC - 1381

# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අමු / වියළි සලාක, සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ප්‍රසම්පාදනය

### කොන්ත්‍රාත්තුව හඳුනා ගැනීමේ අංකය : S&T/3/DRY RATION/FRESH RATION/2020 (28)

01 ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙනුවෙන් අමු ආහාර, වියළි ආහාර සහ සකස් කළ ආහාර ප්‍රසම්පාදනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කඳවුරු සඳහා පහත සඳහන් ප්‍රවර්ගයේ ආහාර අයිතමයන් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනයන්, නිෂ්පාදකයින්, සමාගම් සහ සීමිත වගකීම් සහිත සමාගම් සහ අනෙකුත් වෙළඳ ආයතන වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. සැපයුම් කාලය 2020 ජනවාරි 01 වෙනි දින සිට 2020 දෙසැම්බර් 31 වෙනි දින දක්වා වේ.

**සේවා ස්ථාන සමූහ සමග අදාළ ප්‍රවර්ගයන්**

| සේවා ස්ථානය | | | | | | කාණ්ඩය |
|---|---|---|---|---|---|---|
| **1.1 A කාණ්ඩය - හමුදා කඳවුර** | | | | | | |
| 1.1.1 | අඹේපුස්ස | 1.1.30 | කොහොඹගස්හංදිය | 1.1.59 | පාන්ගොල්ල | |
| 1.1.2 | අයියකච්චි | 1.1.31 | කොක්එළිය | 1.1.60 | පූනානි | |
| 1.1.3 | අම්පාර | 1.1.32 | කොස්ගම | 1.1.61 | පුත්තලම | |
| 1.1.4 | අකුරේගොඩ | 1.1.33 | කොත්මලේ | 1.1.62 | පුදුකුඩිඉරුප්පු | |
| 1.1.5 | බදුල්ල | 1.1.34 | කෝමාරිය | 1.1.63 | රන්ටැඹේ (රන්දෙනිගල) | |
| 1.1.6 | බටලන්ද | 1.1.35 | කුරුණෑගල | 1.1.64 | සේනපුර | |
| 1.1.7 | බූස්ස | 1.1.36 | කුරුවිට | 1.1.65 | සිංහපුර (වැලිකන්ද) | |
| 1.1.8 | බුත්තල | 1.1.37 | කිරන්චි | 1.1.66 | සුංගාවිල | |
| 1.1.9 | දෙහිඅත්තකණ්ඩිය | 1.1.38 | කටුබැද්ද | 1.1.67 | තන්තිරිමලේ | |
| 1.1.10 | දේවහුව | 1.1.39 | කුකුළේගඟ | 1.1.68 | තාරාවිකුලම් | |
| 1.1.11 | දිගන (මාබේරියතැන්න) | 1.1.40 | ලක්ෂපාන | 1.1.69 | ත්‍රිකුණාමලය | |
| 1.1.12 | දොඹගොඩ | 1.1.41 | මාදම්පේ | 1.1.70 | තුනුක්කායි | |
| 1.1.13 | දඹුල්ල (ඉනාමළුව) | 1.1.42 | මැදවච්චිය | 1.1.71 | උඩවලවේ | සියලුම අමු ආහාර වර්ග (එළවළු, පළතුරු, මාළු, මස් / ශීතකළ ආහාර, ලෙලිගැසූ පොල්, බිත්තර (කිකිළි), කිරි ආහාර නිෂ්පාදන) |
| 1.1.14 | ඇඹිලිපිටිය | 1.1.43 | මාදුරුඔය | 1.1.72 | උකුවෙළ | |
| 1.1.15 | ගජසිංහපුර | 1.1.44 | මාන්කුලම් | 1.1.73 | ඌව - කුඩාඔය | |
| 1.1.16 | ගණේමුල්ල | 1.1.45 | මත්තේගොඩ | 1.1.74 | වව්නියාව | |
| 1.1.17 | හොරොව්පතාන | 1.1.46 | මන්නාරම | 1.1.75 | වාකරේ | |
| 1.1.18 | ඉපලෝගම | 1.1.47 | මාතර | 1.1.76 | වාලච්චේන | |
| 1.1.19 | යාපනය | 1.1.48 | මයුරපුර | 1.1.77 | වරනි | |
| 1.1.20 | ජයන්තිගම | 1.1.49 | මොරවැව | 1.1.78 | වීරවිල | |
| 1.1.21 | කලාඔය | 1.1.50 | මහව (බලල්ල) | 1.1.79 | වැලිකන්ද | |
| 1.1.22 | කල්ලඩි | 1.1.51 | නැඳුන්කර්නි | 1.1.80 | වෙල්ලන්කුලම | |
| 1.1.23 | කල්ලාර් | 1.1.52 | නාඋල | 1.1.81 | වෙල්ලන්කුලම (වව්නියාව) | |
| 1.1.24 | කඹුරුපිටිය | 1.1.53 | නුවරඑළිය | 1.1.82 | වැල්ලවාය | |
| 1.1.25 | කතරගම | 1.1.54 | ඔඩ්ඩුසුඩාන් | 1.1.83 | වෙත්තලකර්නි | |
| 1.1.26 | මහනුවර | 1.1.55 | පදවි පරාක්‍රමපුර | 1.1.84 | වේයන්ගොඩ | |
| 1.1.27 | කටුනායක | 1.1.56 | පැලවත්ත | 1.1.85 | විශ්වමඩු | |
| 1.1.28 | කරන්දෙණිය | 1.1.57 | පේදුරුතුඩුව | 1.1.86 | යාල පළටුපාන | |
| 1.1.29 | කෑගල්ල | 1.1.58 | පුනරින් | | | |

| 1.2 B කාණ්ඩයේ - ප්‍රවර්ගය - අමු ආහාර වර්ග | ප්‍රවර්ගය - අමු ආහාර |
|---|---|
| 1.2.1 පනාගොඩ | (i) එළවළු |
| 1.2.2 අනුරාධපුර | (ii) පළතුරු |
| 1.2.3 හිඟුරක්ගොඩ | (iii) මාළු |
| 1.2.4 කන්කසන්තුරේ | (iv) මස් වර්ග / ශීතකල ආහාර |
| 1.2.5 මුලතිව් | (v) ලෙලිගසන ලද පොල් |
| 1.2.6 කිළිනොච්චිය | (vi) බිත්තර - කිකිළි |
| 1.2.7 දියතලාව | (vii) කිරි නිෂ්පාදන |
| 1.2.8 කොළඹ | (viii) $C0^{3}$ තණකොළ |

| 1.3 C කාණ්ඩය - ප්‍රධාන ස්ථාන | |
|---|---|
| 1.3.1 පනාගොඩ | |
| 1.3.2 අනුරාධපුර | |
| 1.3.3 හිඟුරක්ගොඩ | |
| 1.3.4 කන්කසන්තුරේ | වියළි ආහාර අයිතමයන් (අයිතම් 185 ක්) |
| 1.3.5 මුලතිව් | |
| 1.3.6 කිළිනොච්චිය | |
| 1.3.7 දියතලාව | |
| 1.3.8 කොළඹ | |

එක් එක් ආහාර කාණ්ඩයෙහි ආහාර අයිතමයන්ට අදාළ පිරිවිතරයන් සහ අනෙකුත් විස්තර ලංසු ලේඛනය සමග ලබා දෙනු ලැබේ.

සැපයුම් කරනු ලබන සියලුම ආහාර අයිතම නිසි ප්‍රමිතියෙන් යුතුව මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු විය යුතුය. නියමිත තත්ත්ව ප්‍රමිතීන් ලංසු ලේඛනයෙහි සහ එහි ඇමුණුම්හි දක්වා ඇති අතර, ආහාර සැපයුම් කිරීම 1980 හි අංක 26 දරන ආහාර පනත සංශෝධිත පරිදි සහ වරින් වර පනවන ලද රෙගුලාසි අනුව සිදු කළ යුතුය.

1.4 **එක් එක් කඳවුර / සේවා ස්ථාන සහ ආහාර කාණ්ඩයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීම**.

1.4.1 එක් එක් කඳවුර / සේවා ස්ථාන සහ එක් එක් ආහාර කාණ්ඩයන් පදනම් කරගෙන අදාළ එක් එක් කඳවුර සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතුය. සෑම ලංසුකරුවකු විසින්ම අදාළ කඳවුර / සේවා ස්ථානයට සැපයුම් කිරීමට බලාපොරොත්තු වන ආහාර කාණ්ඩයෙහි සියලුම ආහාර අයිතමයන්ට ලංසු තැබිය යුතුය. කිසියම් ලංසුකරුවකු ආහාර කාණ්ඩයක සියලුම ආහාර අයිතමයන්ට ලංසු නොතබන අවස්ථාවලදී එම ලංසුව ප්‍රතිචාර නොදක්වූ ලංසුවක් සේ සලකනු ලැබේ.

සෑම ලංසුකරුවකුහටම පහත කාණ්ඩ තුනක් ලෙස දක්වා ඇති ආකාරයට වෙන් වෙන් වශයෙන් ආහාර කාණ්ඩ එකකට හෝ වැඩි ගණනකට සහ සැපයුම් ස්ථානයන් එකකට හෝ වැඩි ගණනකට ලංසු තැබිය හැක. ඒ අනුව ලංසුකරුගේ හැකියාව සහ සුදුසුකම් අනුව ලංසු ඇගයීම සිදු කෙරේ.

1.4.2 **'A' කාණ්ඩය - එක් එක් කඳවුර සඳහා සියලුම අමු ආහාර ප්‍රවර්ගයන් සැපයීම**

මෙම කාණ්ඩයෙහි ලංසු 86 ක් අඩංගු වන අතර වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර මිල ඇගයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියත් වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

1.4.3 **'B' කාණ්ඩය - එක් එක් කඳවුර සඳහා ප්‍රවර්ගයේ අමු ආහාර අයිතමයන් සැපයීම**

මෙම කාණ්ඩයෙහි ලංසු 64 ක් අඩංගු වන (කඳවුරු 08 X ප්‍රවර්ග 08 – ලංසු 64 ක්) අතර වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර, මිල ඇගයීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලියත් වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

1.4.4 **'C' කාණ්ඩය - එක් එක් කඳවුර සඳහා වියළි ආහාර අයිතමයන් සැපයීම**

මෙම කාණ්ඩයෙහි ලංසු 1480 ක් අඩංගු වන (කඳවුරු 08 X අයිතම් 185 = ලංසු 1480 ක්) අතර වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර, මිල ඇගයීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලියත් වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

02. තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එක් එක් අදාළ ගෙනැවිත් භාරදීමේ ස්ථාන / කඳවුරු සහ අනුඛණ්ඩ වෙත ආහාර ප්‍රවාහනය සම්බන්ධයෙන් වගකිව යුතුය. එක් එක් අදාළ ගෙනැවිත් භාරදිය යුතු ස්ථාන / කඳවුරු සහ අනුඛණ්ඩ පිළිබඳ විස්තර ලංසු ලේඛනයෙහි ඇතුළත් කර ඇත.

03. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි ඡේද 3.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය හරහා සිදු කරනු ලැබේ. විදේශීය සැපයුම්කරුවන් හට ලංසු ඉදිරිපත් කළ නොහැක.

04. ලංසු තැබීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු පුවත්පත් ලංසු දැන්වීම් පළ කරන දිනය වන විට දේශීය ව්‍යාපාර ලියාපදිංචියක් සහිත ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනයක්, නිෂ්පාදකයකු, සමාගමක් සහ සීමිත වගකීම් සහිත සමාගමක් අනෙකුත් වෙළඳ ආයතනයක් (අදාළ ආහාර අයිතම් සැපයීමේ නියුතු ස්ථිතියක්) විය යුතුය. ලංසුකරු අසාධු ලේඛනගත ලංසුකරුවකු නොවිය යුතුය.

05. අවශ්‍යතා සනාථ කරනු ලබන සියලුම ලේඛන ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු ලේඛනයන්හි විස්තර කොට ඇති විස්තරාත්මක ක්‍රමවේදයන් යටතේ, අවමව ඇගයුම් කළ ප්‍රමාණාත්මකව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරු වෙත ප්‍රදානය කරනු ලබන උපරිම කොන්ත්‍රාත් මුදලට ප්‍රතිමුඛව. මෙම සුදුසුකම්, පූර්ව–සුදුසුකම් ක්‍රියාවලියේදී යථා පරිදි සංඛ්‍යාත්මක වටිනාකම අගයනු ඇත. පූර්ව ලංසු – ඇගයුම් කාර්යයේදී පහත සඳහන් අවම සුදුසුකම් සලකා බැලෙනු ඇත.

5.1 පසුගිය ආසන්නතම වසර 02 තුළ තිබිය යුතු අවම වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය රුපියල් මිලියන 10 ක් විය යුතු අතර, ඒ බව අදාළ මූල්‍ය ප්‍රකාශ (2017/2018 විගණනය කළ, 2018/2019 විගණනය කළ හෝ නොකළ) ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන ලංසුකරුවන් විසින්, පශ්චාත් සුදුසුකම් නිරවද්‍ය බව පිරික්සා බලන අදියරේදී විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.

5.2 තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 05 ක් (අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, කෙටිකාලීන ආයෝජන හා ලැබිය යුතු මුදල් ගෙවීම්) විය යුතු අතර, එම කරුණු එක් එක් මූල්‍ය ප්‍රකාශ (2017 / 2018 විගනණය කළ, 2018/2019 විගණනය කළ හෝ නොකළ) මගින් සනාථ කළ යුතුය. කෙසේ වෙතත්, විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන ලංසුකරුවන් විසින්, පශ්චාත් සුදුසුකම් නිරවද්‍ය බව පිරික්සා බලන අදියරේදී විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.

5.3 බැංකු හා මූල්‍ය ආයතන විසින් සහතික කර, තිබිය යුතු අවම ණය පහසුකම් ප්‍රමාණය (මෙම ටෙන්ඩරයට විශේෂිතව) රුපියල් මිලියන 05 ක් විය යුතුය.

5.4 ලංසුකරු සඳහා අවසන් වර්ෂ 2 ක් තුළ (2017 – 2018) රාජ්‍ය ආයතන වෙත හෝ වෙනත් ආයතනයක් වෙත ආහාර සැපයීම සම්බන්ධයෙන් තහවුරු කළ හැකි සතුටුදායක පළපුරුද්දක් තිබිය යුතුය.

5.5 අමු ආහාර ද්‍රව්‍ය සැපයීමේදී, ලංසුකරු වෙත ප්‍රමාණාත්මක ගබඩා පහසුකම් (එනම් අවශ්‍ය ගබඩා, ශීත කාමර හා ශීත ට්‍රක් රථ, ආදිය ලබාදීමේ ක්‍රමවේදයන්) තිබිය යුතුය. (මේවා ලංසුකරු සතු හෝ බද්දට / කුලියට ගත් ඒවා විය හැක) මේ සම්බන්ධ අමතර විස්තර ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.

5.6 වියළි ආහාර අයිතමයන් සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත්, ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට / කුලියට ලබාගෙන තිබිය හැක) සපසුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදක් සඳහන් කළ යුතුය. මේ සම්බන්ධ අමතර විස්තර ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.

06. **ලංසු ලේඛන නිකුත් කිරීම ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීමට අදාළ දිනය සහ වේලාව පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| **ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය** | : | 2019.08.02 |
| **ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව** | : | 2019.08.22 දින ප.ව. 4.00 දක්වා |
| **ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය සහ වේලාව** | : | 2019.08.23 දින පෙ.ව. 9.00 දක්වා |

**ලංසු විවෘත කරන අවසාන දිනය සහ වේලාව** :

| | | |
|---|---|---|
| **සියලුම අමු ප්‍රවර්ගයන්** | - | 2019.08.23 දින පෙ.ව. 9.00 |
| **වර්ගීකරණය කරන ලද අමු ආහාර** | - | 2019.08.23 දින පෙ.ව. 9.00 |
| **වියළි ආහාර** | - | 2019.08.23 දින පෙ.ව. 9.00 |

07. පූර්ව ලංසු රැස්වීම 2019 අගෝස්තු 07 වන දින පෙරවරු 10.00 පැයට ප්‍රධාන ශ්‍රවණාගාරයේ 03 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, බාලදක්ෂ මාවත, කොළඹ 03 ලිපිනයෙහි පැවැත්වේ.

08. පහත ඡේද 16 හි සඳහන් ලිපිනයෙන් ලංසුකරුගේ ලිඛිත ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ අධ්‍යක්ෂ සැපයුම් හා ප්‍රවාහන මගින් ලංසුකරුවන් හට නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් මිලදී ගත හැක. ආපසු නොගෙවනු ලබන වටිනාකම 2016 ජූනි මස 17 වන දිනැති 06/2016 අංකය දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව තීරණය කරනු ලැබේ. (එක් එක් ලංසුවට අදාළව ආපසු නොගෙවනු ලබන වටිනාකම් පිළිබඳ විස්තර පහත ඡේද 16 හි සඳහන් ලිපිනයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගත හැක)

09. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසු ලිපිලේඛන සමග ලබා දී ඇති ආකෘති පමණක් ලංසුකරුවන් විසින් භාවිතා කළ යුතුය. සියලුම ලංසු අනුපිටපත් සහිතව ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ ගෙනවිත් භාරදීමෙන් නැතහොත් මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් 6 ඡේදයෙහි සඳහන් නියමිත දිනයට සහ වේලාවට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

11. ඉදිරිපත් කරන ලංසුවෙහි වලංගු කාලය 2020 මාර්තු මස 31 වන දින දක්වා විය යුතුය.

12. ඉදිරිපත් කරන ලංසුව සමග 2020 අප්‍රේල් 30 වන දින දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණ ඇපකරයක් ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය නමට ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකු විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නාලද කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණ ඇපකරයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. (අදළ බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) ලංසු සුරක්ෂණ ඇපකරයෙහි වටිනාකම 2006 – ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විස්තර කොට ඇති පරිදි එක් එක් ලංසුව සඳහා සඳහන් කොට ඇත.

13. සියලුම සැපයුම්, ලංසු ලිපිලේඛනයන්හි ඉල්ලා ඇති පරිදි සහ සඳහන් කර ඇති පරිදි නිෂ්පාදකගේ බලය පැවරීමේ සහතික ඉදිරිපත් කිරීමට යටත්වේ.

14. තාක්ෂණික ඇගයීම් කමිටුව / ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ මගපෙන්වීම මත ආරක්ෂක අමාත්‍යාංශයේ ආහාර ප්‍රසම්පාදන සහ ආවේක්ෂණ ඒකකයෙහි ඉල්ලීම පරිදි ලංසු ලිපිලේඛනයේ අතිරේක තොරතුරු සපයා ඇති අයිතමයන් සඳහා ලංසුකරු විසින් නියැදියන් (SAMPLE) ඉදිරිපත් කළ යුතුය. නියමිත කාල සීමාව තුළ නියැදියන් ඉදිරිපත් නොකරන ලංසුකරුවන්ගේ ලංසු ඉදිරියට ලංසු ඇගයීම සඳහා සලකා නොබලන අතර, ප්‍රතිචාර නොදක්වූ ලංසුවක් වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. මේ සඳහා උනන්දුවක් දක්වනු ලබන සුදුසුකම් ලත් ලංසුකරුවන් වැඩි දුර තොරතුරු යුද්ධ හමුද මූලස්ථානයේ සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැකි අතර, 2019 අගෝස්තු 02 වෙනි දින සිට 2019 අගෝස්තු 22 වෙනි දින දක්වා රාජකාරි දිනවල පෙ.ව. 9.00 පැය සිට ප.ව. 3.00 පැය අතර පහත 16 ඡේදයේ ලබාදී ඇති ලිපිනයේ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැක.

16. ඉහත සඳහන් කළ ලිපිනය නම්,


**අවධානය** - **සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ**

**ලිපිනය** - **යුද්ධ හමුදාපති**

**යුද්ධ හමුදා මූලස්ථානය, දකුණු පර්ෂදය, ගාලු මුවදොර ටෙරසය, කොළඹ 03.**

**දුරකථන අංකය** - **0112302569, 0112302568**

**ෆැක්ස්** - **0112302569**

**ඊමේල්** - **dtesandt@army.lk**

**සභාපති,**

**අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**

**(ත්‍රිවිධ හමුදාවන් සඳහා අමු ආහාර සහ වියළි සලාක ප්‍රසම්පාදනය),**

**ආරක්ෂක අමාත්‍යාංශය**


2019.07.26